

# අසෙනිය කුසුම

නිරාෂ ගුණසේකර



**'අසෙනිය කුසුම' තීරුව දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳුද යන්න සහෘද ඔබත් සමඟ බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තොරාගනු ලබන කවියක් හොඳද නරකදැයි නිගමන නොදී, මිණුම් දඬු හා විචාරක්ෂීන් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

## කෙසේ හෝ හෙළි කර ගත යුතු රහසක්ය

සෙව්වෙමි විසක්
විලවුන් සුවඳක්
ඔහුගෙ කමිසවල
සිතුවෙමි සිහින් සර්පයන්
ගුලි වී සිටිතියි සාක්කු තුළ

එහෙත් තිබුණේ හැමදාම
දිගු හුස්මකට දැනෙන
සියුම් ඩහදිය සුවඳ
හතරට නවන ලද
තනි බස් ටිකට් එක

හෝඩුවාවක්
කොයි වෙලේ හෝ
රිංගතියි සිතුවෙමි
රිසීවරයෙන් කණට

නමුත් සැමවිට
සුසුම මුදවා
අත වෙව්ළුම් නවතා
කතා කළේ ඔහුමයි
ආදරෙයි කීමට

පිරික්සුවෙමි මුහුණ
සෙවිල්ලේ සිටියෙමි
කැළඹුමක් සෙළවේදැයි කොපුළත
මගේ මුහුණ ඇත්දැයි නෙත් තුළ

එතකුදු නොසැලී ඔහු
පිළිමයක් ලෙස
පිරිමදී බැල්මකින් සිත
පුරුදු විදියට

රහසක් නොලැබී
වරදින විට වෑයම
ඇවිස්සෙයි කෝප දුහුවිලි
යම්තමට සිත යට

දැන් දැන් විසක්
සර්ප හිසක්
මතු වෙයි - සෙළවෙයි මා තුළ
නුරුස්නාවක්
වැවෙයි ටික ටික

නොබැඳෙන්නෙ ඇයි
ළඳක් ඔහු වෙත
නළඟනක සිත ගන්නවත්
ඔහුට නොහැකිද?

**ලක්ශාන්ත අතුකෝරල**

( 'සමහර කමටහන්' කාව්‍ය සංග්‍රහය - 2016)

පිරිමියකු කෙරෙහි සාම්ප්‍රදායික ගැහැනියක කෙරෙන් නිසර්ගයෙන්ම උපදින 'සැකය' නම් ගති සොබාව පාදක කොට ගෙන ලියැවුණ කවියකි මේ. ගැහැනියකගේ සැකය යනුම එතරම් අරුම පුදුම මාතෘකාවක් නොවුණද, එය සෑම කාන්තාවක් කෙරේම අඩු වැඩි වශයෙන් පිහිටියා වූ ජානමය ලක්ෂණයක් සේ ඔවුනටම බද්ධ වූ දෙයක් වුවද එවන් සුලභ මාතෘකාවකට පවා අපූර්වත්වයක් කැටි කරන්නට, මඳක් වෙනස් ආකාරයෙන් ඒ දෙස බලන්නට හැකිවී ඇත්තේ ලක්ශාන්තගේ ප්‍රතිභාව හා කවිත්වය නිසාය; මෙහිදී ඔහු යොදා ගන්නා භාෂාව නිසාය.

අප කථකයා මේ කවිය



ලියන්නේ/කියන්නේ, ගැහැනියකගේ සිරුරට ආරූඪ වීමෙනි. එනම් කාන්තා ස්වරයෙනි. සහේතුකව හෝ අහේතුකව සැමදා කාන්තාවන්ගේ සැකයට භාජනය වන පිරිමි සංහතිය වෙනුවෙන් ගැහැනු සිරුරක් ඇතුළට පැන මේ දේ ඇගේ වචනවලින් හඬගා කියන්නට ලක්ශාන්ත නිර්භය වීම මුළු මහත් පිරිමි සංහතියම ඒ සැකයෙන් මුදවා ගැනීමේ ප්‍රයත්නයක් සේය. ගැහැනියක විසින් මේ දේ ලියනවාට වඩා වැඩි අපූර්වත්වයක් මේ තුළ ජනිත වන්නේ ඒ නිසාමය. නැතිනම් අපගේ, එනම් පිරිමි පාර්ශවයේ අවිඥානයේ ඇති අපි නිවැරදියි යන මතය ගැහැනියකගේ හඬින් නොනැගෙන තැන, කොහේ හෝ සිටින අප නොදන්නා ගැහැනියක් අප වෙනුවෙන් මේ විදියට සිතනවා යැයි කීම සමස්ථ පිරිමි ප්‍රජාවම ඒ සැකයේ මූලයන්ගෙන් නිදොස් කොට නිදහස් කිරීමක් බඳුය. දැන් අපි කවිය වෙත හැරෙමු.

කවිය ඇරඹෙන්නේ කුටුම්බය තුළ තම ස්වාමිපුරුෂයාගේ රහස් අංශුමාත්‍රයන් එකින් එක සොයා පාදා ගන්නට තැත් දරන සැකයේ හිණි පෙත්තට නැග ගත් සාම්ප්‍රදායික කාන්තාවකගේ හැසිරීම් රටා හා සිතැඟි විදාරණය කිරීමෙනි. පළමු පදයේ සිටම ගලන්නේ මේ අනවරත සැකයයි. කවියා කොහේ දී වත් මේ සැකය ප්‍රාදුර්භූත වූයේ කොහෙන්දැයි නොපවසන අතර එක අතකට එසේ පවසන්නට අවශ්‍යද නොවේ. මන්ද, කාන්තාවකට පිරිමියෙකු සැක කරන්න හේතු අනවැසි බැවිනි. ඈ අන් කාන්තාවකගේ විලවුන් සුවඳක් තම ස්වාමි පුරුෂයාගේ කමිස අතරේ සොයයි. ඈ එලෙස ඉව අල්ලමින් කිසියම් හෙ- ාරයක් අල්ලා ගන්නට තැත් දරන්නේ ඇයිදැයි අපි නොදනිමු. සමහර විට මුළු දවස පුරාම කුටුම්බය තුළ සිරගත මේ කාන්තාවගේ සමාජ ලෝකය එතරම් පුළුල් නොවූවක් විය හැකි අතර, වඩාත් පුළුල් සමාජ ලෝකයකට විවර වූ තම සැමියා රැකියාවට ගොස් වැඩ අවසන්ව ගෙදර එන විටත් හුදකලා සිතුවිලිවල නිමග්න වී සිටින මෑ හට විවිධාකරයේ සිතුවිලි හිතට විත් මෙවැනි අනවශ්‍ය ප්‍රශ්නා වද දෙනවා විය හැක. නැත්නම් ඒ වෙනුවෙන් ඈටත් කිසියම් සාධාරණ හේතු තිබෙන්නට පුළුවන් වුණත්, අප කවියා ඒ දේවල් නොකියන්නට පරිස්සම් වීමෙන් මුළු මහත් පිරිමි සංහතියම වඩාත් හොඳ තැනක තබන්නට සමත්වේ. විලවුන් සුවඳ විමසා නතර නොවන ඈ අනතුරුව ඔහුගේ සාක්කු තුළටත් කිඳා බසින්නීය. ඈ ඒවායේ සිහින් සර්පයන් ගුලිවී ඉන්නට ඇතැයි අපේක්ෂා කරයි. මේ ගුලිවී සිටින සිහින් සර්පයන් කවුරුන් විය හැකිද? කවියා මින් අදහස් කළේ දඟරගැසී කුඩා ප්ලාස- ්ටික් පැකට්ටුවක් තුළ සැඟවී සිටින මුව අයාගත් රබර් නයෙක් බඳු කො- ්ඩමයක් ගැන විය නොහැකිද? නමුදු ඈට ඈ අපේක්ෂා කරන ඒ කිසිවක් හමු නොවේ. විලවුන් සුවඳ වෙනුවට දැනෙන්නේ රටක් වටින මේ මනුස්සයාගේ සියුම් ඩහදිය සුවඳය; රබර් නයින් වෙනුවට හතරට නැවූ තනි 'බස් ටිකට්ටු' ය. මේ තනි බස් ටිකට්ටුව පවා ඉඟි කරන්නේ හෙතෙම තනිවම ගෙදර ආ බව නොවේද? එතන ටිකට්ටු දෙකක් නැත. එතරම් හොඳ මනුස- ්සයෙක් ගැන මෙතරම් සැක කිරීම කොතරම් දුරට සාධාරණද? සමහර විට ඔහු ටිකට්ටු දෙකක් මිලට ගෙන එකක් මග දමා එන්නට ඇත. නමුත් අප ඒ ගැන වදවිය යුතු නැත. මන්ද මේ කවියෙන් සමස්ථ පිරිමි ප්‍රජාවම වඩාත් යහපත් තැනක පිහිටුවන අතර ගැහැනියකගේ සැකය නිරපරාදයේ සිදුවන්නක් බව පදානුපදිකව සාධනය කොට ඔප්පු කරනා නිසාවෙනි. එය අපට වඩාත් වාසි සහගතය; එනිසාම නිහඬවම ඉමු.

එතෙකින් නොනවතින ඈ නිවසේ දුරකථනය ඔස්සේ වත් ඔහුව පතාගෙන එන කාන්තා කටහඬක් වේ දෝයි සැක කරන්නීය. ඇත්තටම මේ කාන්තාවගේ අවිඥානය ඈටත් හොරෙන් එවැනි රහස් සබඳතාවක් තම සැමියා කෙරෙන් අපේක්ෂා නොකරන්නේද? මේ නිරපරාදයේ ඔඩු දුවන සැකය යථාර්ථයක් නොවන්නේ මන්දැයි යන්න ඇගේ යටි සිතේ ආශාව බවට පත් වී ඇති සෙයකි. සමහර විට මේ අනවශ්‍ය සැකයම එවන් වූ කටුක යථාර්ථයකට මං පෙත් විවර කර දෙන බව කාන්තාවන් කවමදාවත් තේරුම් නොගන්නා සත්‍යයකි. දුරකථනය නාද වූ සැණින් වහා දුව ගොස් සවන් දුන්නද, ඈ අපේක්ෂා කරන ලාලිත්‍යය මුසු කටහඬ වෙනුවට ඈට ඇසුණේ සුසුම් මුදවා ආදරෙයි කියන සැමියාගේ කටහඬමය. ඇගේ වෙව්ළනා දෑත ගල් වී බලාපොරොත්තු සුන් වී යයි. ඇගේ සැකය එවරත් එල නොනැගේ.

සැමියා නිවසට ගොඩවූ සැණින් මුහුණට එබෙන ඈ ඉතා පිරික්සුම්කාරීව බලන්නේ සැමියාගේ මුහුණේ කිසියම් අමුත්තක්, රතක්, රැල්ලක් කැළඹුමක් තියේ දැයි කියාය; ඈ දෙස හරි කෙළින් බලනවාදැයි කියාය; ඒ ඇස් තුළ ඒ නිසා වෙන්ම ඇගේ මුහුණ පිළිබිඹු වී තියේ දැයි කියාය. නමුදු ඒ සියලු උත්සාහයන් ව්‍යර්ථ වී යයි. නොසැලී හිඳිමින් පිළිමයක් සේ සීරුවට පුරුදු ලෙසම හේ ඈ දෙස දයාර්ද්‍ර බැල්මක් හෙළයි. ඈ ඒ ඔස්සේ පැරදී යයි. ඈ සොයන, ඈ අපේක්ෂා කරන සැකය වෙනුවෙන් කිසිදු ධනාත්මක පිළිතුරක් මේ වෙනතුරාම නැත. ඈ වෙනුවෙන්ම, ඇගේ සැකය සපුරනු වස් පිරිමියකු වරදේ බැඳුනේ නම් එහි වැරැද්දත් ඈම බාරගත යුතු නොවේද? මන්ද දිගින් දිගටම ඈගෙන් ඒ වෙනුවෙන් ලැබෙන පෙළඹුම කොහේ වත් නැති ප්‍රශ්නයකට පිරිමියා බලෙන් ඇද දමනා අවකාශයක් තනනා බැවිනි.

ඇගේ සියලුම උත්සාහයන් සුණු විසුණු වන විට කිසිදු රහසක් සොයා ගනු නුහුණු විට ඈ සිතට කෝපයක් නැගේ. ඇත්තටම බැලුවොත් එවැනි අනියම් කාන්තා ඇසුරක් තම සැමියා ළඟ නැත්නම් වඩාත්ම සතුටු විය යුත්තේ ඈම නොවේද? නමුත් ඈ විසින්ම ඇගේ මනසේ හදා වඩා ගත් මේ ප්‍රශ්නයට ඈ අපේක්ෂා කරන පිළිතුර නොලැබීයාම තුළ ඈ වඩාත් ප්‍රචණ්ඩත්වයකට පත්වේ. ඉතින් කාට මේ පැමිණිලි කරන්නද? ඒකපාර්ශ්විකව හදා වඩා ගත් සැකය ඇතුළේ ඈ ලබන මේ විඳවීම ඈ එලෙසම ලැබිය යුත්තක් බවට මේ කවිය අපට ඒත්තු ගන්වයි. ඉතින් අපට අසන්නට ඇත්තේ 'ගස් වැවූ ඇත්තන්ම එලත් ලැබිය යුතු නොවේදැ'යි යන්නයි.

කෝප දුහුවිල්ලෙන් ඇගේ සිත ඇවිස්සී ඇත; වේදනාවෙන් පෙළෙයි. නුරුස්නාවක් හෙමි හෙමින් වැවෙමින් විස පිරුණු සැපින්නකගේ තත්ත්වයකට ඈ පත්වේ. ඉතින් මේ සියල්ල වෙනුවෙන් අර අහිංසක පිරිමිය මොනවා කරන්නද? ලක්ශාන්ත අප සැවොම වෙනුවෙන් ඔහුගේ සැබෑ ජීවිතයේ පළපුරුද්දත් උපයෝගී කරගෙන නීතීඥයකු ලෙස පෙනී සිටිමින් පිරිමි අප නිදොස් යැයි ඔප්පු කරනට මේ කාන්තාවගේ කටින්ම ඔහුට අවශ්‍ය වචන එළියට ඇද ගනිමින් ඇගේ ආත්මය විවර කොට අපට පෙන්වයි. ඈට තියෙන්නේ අනවශ්‍ය සැකයක් බව යළි යළිත් ඒත්තු ගන්වයි.

මේ කවිය කූට ප්‍රාප්තියට එන්නේ අවසාන කොටසෙනි. සැපින්නකගේ තත්ත්වයට පත්වුණු පරාජිත ඈ අවසානයේ සිතන්නේ ළඳක් ඔහු වෙනුවෙන් නොබැඳෙන්නේ ඇයි කියාය? ඇත්තටම සතුටු විය යුතු කරුණක් හමුවේ ඈ නිරපරාදයේ විඳවයි. අප කවියා ගැහැනි යකගේ ස්වරයෙන් මේ පවසන්නේ පිරිමි ලෙස අප සැවොම සිතන දේ නොවේද? ඔහු මේ කවියේ අවසානයට තවත් කොටසක් එකතු කරයි. ළඳක් ඔහු වෙනුවෙන් නොබැඳෙන්නේ නම්, අඩුම් වශයෙන් තම ස්වාමියාට නළඟනකගේ සිත ගන්නවත් පුරුෂ ශක්තියක් නැත්දැයි කියා අසන පැනයයි. සැකයේ මුදුන් පෙත්තට පැමිණ අපේක්ෂිත කිසිදු පිළිතුරක් නොලද තැන, මිදි තිත්තයි න්‍යාය යොදා තම පුරුෂයාට අන් ගැහැනියක තම වසඟයට ගන්නට තරම් වත් හැකියාවක් නැතැයි කියන පටු  තැනකට මේ ප්‍රශ්නය ඌණනය කිරීමයි. එය ඉතාම සදය උත්ප්‍රාසවත් අවසානයක් වන අතර සැකයෙන් මිරිකුණු කුටුම්බ ඇතුළේ එවන් වූ අසරණ ගැහැනුන් කෙරේ අනුකම්පාවක් දනවන්නත් උපකාරී වේ.

මේ කවිය ඉතාම සුලභ මාතෘකාවක් ඔස්සේ ලියැවුණද අතිශය සංකීර්ණ කවියකි. ඉදිරිපත් කරන ආකාරයේ ඉඳන්ම එය අපූරුය. ගැහැනියකගේ සිතේ ඇතිවන සැකය වාගේම, ගැහැනියකට සැක නොහිතෙන ආකාරයට ජීවිතය නඩත්තු කරගෙන යා  හැකි පිරිමි පාර්ශවයේ මනා හැකියාවන් ගැනත් මේ කවියෙන් කියැවේ. ඇත්තටම මේ කවියෙන් නොකියවෙන්නේ ඒ දෙයයි. මෙහි සඳහන් ස්වාමි පුරුෂයා මේ මාතෘකාව සම්බන්ධව ඉතාමත් තීක්ෂණ, කෙළ පැමිණි පුද්ගලයකු විය හැක. ලක්ශාන්ත නොකියා කියන කවිය එයයි. කවියකින් නොකියවෙන දේම තමයි 'කවිය' කියන අප අසා ඇති කියමන වඩාත් සනාථ කරන කවියකි මේ. සාම්ප්‍රදායික ගැහැනියකගේ සැකය නම් කාරණාවත් ඒ ඔස්සේ සැකය යතාර්ථයක් බවට පත්වීම දක්වා වර්ධනය වීමත් වැනි කරුණු කියව ගන්නට මේ කවියෙන් මාවත් විවර කර දේ. සැකය එල නොදරන තැන ඉච්ඡාභංගත්වයට පත්වී විවිධ ව්‍යසනයන්ට මුහුණ පෑමත්, අවිඥානිකව සැකයම යථාවක් වන්නැයි පැතීමත් මිනිස් සිත් සංතානවල විවිධාකාරයේ හැසිරීම් රටාය. ඒ අනුව සංකීර්ණ වින්දන පථයක් සදා දෙන්නට මේ කවිය සමත් වේ. අවසාන වශයෙන් පිරිමි සංහතිය වෙනුවෙන්ම ගැහනියකගේ ඇඟට පැන මේ කවිය ලිවීම වෙනුවෙන් ලක්ශාන්තට තුති; දැන් අපි නිදහස්!